## 1.1 හින්දී සහ සිංහල භාෂාවේ නාම විශේෂණ පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

නීතා සුභාෂිණී සෙනෙවිරත්න
හින්දී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

---

### ABSTRACT

යම් භාෂාවක ලේඛනයට මෙන් ම භාෂණයට ද බෙහෙවින් උපයෝගී වන ව්‍යාකරණ ඒකකයක් ලෙස විශේෂණ පද දැක්විය හැකිය. යම් පදයක් විස්තර කිරීමට, වර්ණනා කිරීමට යොදා ගන්නා පදය 'විශේෂණ' ලෙස හැඳින් වේ. මෙම විශේෂණ පද මූලික වශයෙන් නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ ලෙස වර්ගීකරණය කළ හැක. ඒ අතුරින් හින්දී සහ සිංහල භාෂා ද්වයෙහි නාම විශේෂණ පිළිබඳ ව විමර්ශනයක් සිදු කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ.

නාම විශේෂණය යනු නාම පදයකට විකාශනයක්/විස්තරයක් වශයෙන් යෙදෙන පදයයි. එසේ විශේෂණය කරනු ලබන පදය 'විශේෂ්‍ය' නම් වේ. හින්දී භාෂාවේ නාම විශේෂණ ප්‍රධාන වශයෙන් 'අවිකාරී විශේෂණ' සහ 'විකාරී විශේෂණ' ලෙස ප්‍රභේද දෙකකට විභේදනය කළ හැකිය.

විශේෂ්‍යයේ ලිංග, වචන, විභක්ති යන ව්‍යාකරණමය ප්‍රවර්ගවලට අනුව රූපීය වෙනසකට භාජනය නොවන විශේෂණ 'අවිකාරී විශේෂණ' නම් වන අතර විශේෂ්‍යයේ ලිංග, වචන, විභක්ති යන ව්‍යාකරණමය ප්‍රවර්ග වලට අනුව රූපීය වෙනසකට භාජනය වන විශේෂණ 'විකාරී විශේෂණ' නම් වේ. හින්දියෙහි බොහෝ -ආ ස්වරාන්ත විශේෂණ 'විකාරී විශේෂණ' ලෙස සැලකේ.

එහෙත් සිංහල භාෂාවේ නාමපදය (විශේෂ්‍යය) කවර ලෙසින් යෙදුණත් නාම විශේෂණයෙහි කිසිදු රූපීය වෙනසක් සිදු නොවේ.

හින්දී සහ සිංහල භාෂා ද්වයෙහි නාම විශේෂණ සම්බන්ධ ව දක්නට ලැබෙන මෙම අසමාන ලක්ෂණය හේතුකොට ගෙන හින්දී භාෂාව හදාරන ආධුනික විද්‍යාර්ථීන්ට නාම විශේෂණ භාවිතයේ දී ගැටලු සහගත අවස්ථා උද්ගත වේ. මෙම විමර්ශනයෙන් එම ගැටලුව තුලනාත්මක ව අධ්‍යයනය කිරීමට අවකාශ සැලසේ. හින්දී භාෂාවේ නාම විශේෂණ හා සම්බන්ධ උක්ත විශේෂ ලක්ෂණ පිළිබඳ මනා අවබෝධය එම භාෂාවේ නිපුණතාව කෙරෙහි බෙහෙවින් ඉවහල් වේ.